සැ. යු. — 2013.11.15 වැනි දින පළ වූ අංක 1,837 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,838 - 2013 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2013.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 2498 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 2500 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 දෙසැම්බර් මස 13 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 නොවැම්බර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1 - B 80787— 3,400 (2013/11)
F 1 -

# පළාත් සභා නිවේදන

## ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාණිජ/කෘෂිකාර්මික හෝ නේවාසික කටයුතු සඳහා ඉල්ලුම්කරුවන් අතරින් තෝරාගනු ලැබූවන් සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ වූ නිවේදනය

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලබා දීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ගිරිබාව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2013 දෙසැම්බර් මස 20 දින පෙ.ව. 10.30 ට ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

- *(අ)* ඉඩම් වල නම් :
- *(ආ)* ඉඩමේ මැනුම් විස්තර : අ.ග.පි. 3737, අ.ග.පි. 3441, අ.ග.පි. 3692, අ.ග.පි. 3695
- *(ඇ)* ඉඩම පිහිටි ගම් : වන්නිකුඩාවැව, අලියාවැටුනුවැව, මඩිගේ, තඹුත්ත
- *(ඈ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය : වන්නිකුඩාවැව, අලියාවැටුනුවැව, මඩිගේ, තඹුත්ත
- *(ඉ)* උප දිසාපති හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ගිරිබාව
- *(ඊ)* දිස්ත්‍රික්කය : කුරුණෑගල
- *(උ)* අන්සතු කරනු ලබන ඒකකය : ගොඩ හා මඩ
- *(ඌ)* අන්සතු කරනු ලබන ඒකකය :
  - නේවාසික උපරිම : පර්. 20, අවම : පර්. 15
  - වාණිජ උපරිම : පර්. 20, අවම : පර්. 2 1/2
  - කෘෂිකාර්මික උපරිම : අක්කර 10, අවම : අක්කර 01

2\. ඉල්ලුම්පත්‍ර කැඳවනු ලබන්නේ පහත දැක්වෙන පංතියට හෝ පංතිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම් පත්‍ර අනුව ය.

-ගොවි පංතියට අයත් නොවන-

ඉහත සඳහන් පංතිවලට අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ලේඛන ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

3\. සියලුම ඉල්ලුම්පත්‍ර 2013 දෙසැම්බර් 20 වැනි දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගිරිබාව" වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

4\. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2013 දෙසැම්බර් මස 20 වැනි දින පෙ.ව. 10.30 ට ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා දැනුම් දෙනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට ඉල්ලුම්කරු විසින් පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයකු ලියවිල්ලක් මඟින් ඉදිරිපත් කළ යුතු ය.

5\. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ එයින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6\. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම දීර්ඝකාලීන බදු බලපත්‍රයක් සකස් කරන අතර ඒ සඳහා රජයේ තක්සේරුව මත තක්සේරු මුදල ගෙවිය යුතු ය.

7\. ඉඩම් කච්චේරියේ දී තෝරා ගන්නා පුද්ගලයින් සියලුම දෙනාම 2008/4 චක්‍රලේඛ යටතේ ලියාපදිංචි වූ පුද්ගලයින් විය යුතු ය.

8\. ඉහත සඳහන් ඉඩම් කච්චේරි පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථාන වල දී ලබාගත හැකි ය.

- (i) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) - පළාත් ඉ. කො. කාර්යාලය, කුරුණෑගල,
- (ii) ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගිරිබාව.

ඉඩම් කොමසාරිස්.

2013 ඔක්තෝබර් මස 28 වැනි දින.

ඉල්ලුම් පත්‍රයේ හා දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත :-

### දිවුරුම් ප්‍රකාශය

....................... දිස්ත්‍රික්කයේ...................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ.................. ග්‍රාම නිලධාරි වසමේ.................... පදිංචි............................. වන මම, පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ භාර්යාවට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන්ට ද, සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපොළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශනයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේ ඉහත කී අක්කර .................... රූඩ්. ........................ පර්. ...................... ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත්, වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

__________,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

__________,
සාමදාන විනිශ්චයකාර තැන.

### ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජයේ ඉඩම් ආඥාපනත යටතේ රජයේ ඉඩම් පුළුල් කිරීම සඳහා බෙදා දීමට ඇති ඉඩම් වෙනුවෙන් වාණිජ/කෘෂිකාර්මික හෝ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබාදීමට ඉල්ලුම්කරුවන් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය

1. සම්පූර්ණ නම :—————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
3. (i) ලිපිනය :—————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :—————.

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ආ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
4. ගෘහ මූලික අංකය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට) :————.
7. උපන් දිනය :————.
8. විවාහක/අවිවාහක ද යන බව :————.
9. රැකියාව :————.
10. රැකියා කරන ස්ථානයේ ලිපිනය :————.
11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හා භාර්යාව) ඇතුලු මුලු පවුලේ වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම (රුපියල්) |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය සඳහන් කරන්න. :————.
14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය : (තමාගේ ද?/බද්දට ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග) :————.
15. නිවස පිහිටි ස්ථානය :————.
16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————.
17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන්නේනම් පාසලේ/විද්‍යාලයේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිළ දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :————.
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :——.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :————.

19. පවුලේ යම් සාමාජිකයෙක් මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |

20. ඉඩම්ලාභියකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙළිවුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

අනු අත්සන් කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :————.
ලිපිනය :————.

11-710

# අතුරු - ව්‍යවස්ථා

**බලංගොඩ ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂයයභාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2013 මස වැනි දින.

**බලංගොඩ ප්‍රාදේශීය සභාවේ එල්. පී. වායු මගින් ක්‍රියාත්මක දාමහන ආදාහනාගාරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව බලංගොඩ ප්‍රාදේශීය සභාවේ එල්. පී. වායු මගින් ක්‍රියාත්මක දාමහන ආදාහනාගාරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින් වේ.

2. බලංගොඩ ප්‍රාදේශීය සභාවට අයත් දාමහන ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීම, ගාස්තු නියම කිරීම හා අය කිරීම සහ ආදාහනාගාර පාලනය විධිමත් කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. බලංගොඩ ප්‍රාදේශීය සභා සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු දාමහන ආදාහනාගාරයේ කිසිදු මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

4. තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන (මෙහි මතු ඉල්ලුම්කරුයයි සඳහන් කරනු ලබන) තැනැත්තකු විසින් "අ" උපලේඛනයට අනුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

   (i.) මියගිය තැනැත්තා හා ඉල්ලුම්කරු අතර සම්බන්ධතාවය තහවුරු කිරීම සඳහා මියගිය තැනැත්තා පදිංචිව සිටි ග්‍රාම සේවා කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ;

   (ii.) ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් ;

   (iii.) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණ පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41 (ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය. එහි 7 වැනි තීරුවේ දාමහන ආදාහනාගාරයේ, ආදාහනය කිරීම යනුවෙන් සඳහන් විය යුතු ය.

   (iv.) අජීවී උපතකින් බිහිකරන ලද මෘත ශරීරයක් නම්, උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 43(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

5. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය සභාපතිවරයා වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබූ අනුපිළිවෙල අනුව ලේඛන ගත කල යුතු වේ.

6. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාරගනු ලබන්නේ නම්, ඒ සඳහා නියමිත ගාස්තුව සහ රුපියල් දහසක තැන්පත් මුදලක් අය කර ගෙන අවසරපත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. ආදාහනාගාර භාරකරු වෙත මෘත ශරීරය භාරදිය යුතු වේලාව අවසර පත්‍රයේ සඳහන් කල යුතු ය.

7. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම්, ඒ බව එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට ලිඛිතව දැන්විය යුතු ය.

8. සෑම දිනකම පෙ.ව. 6.30 සිට ප.ව. 7.00 දක්වා කාලය ඇතුලත ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරගනු ලැබේ.

9. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන් කර ඇති වේලාව හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත භාරදිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇති වෙන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

10. ආදාහනාගාරයේ ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය, මියගිය අයගේ නම හා ඔහු මියයාමට ප්‍රථම පදිංචිව සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා සමග තිබූ සම්බන්ධතාවය, ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ආදාහනාගාර භාරකරු විසින් ලේඛන ගත කළ යුතු ය.

11. 1975 අංක 41 දරන විවාහ, උප්පැන්න හා මරණ (සංශෝධිත) පනතේ සංශෝධිත උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ විධිවිධාන යටතේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයකු විසින් නිකුත් කරනු ලැබූ මරණ ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ අදාළ වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් නොමැතිව කිසිම මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

12. මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරය වෙන් කරගන්නා අවස්ථාවේ මෘත දේහය ආදාහනය කිරීමෙන් පසු භස්මාවශේෂ (අළු) තැන්පත් කර තැබීම සඳහා මරණකරුගේ නම හා ලිපිනය සඳහන් කර භාජනයක් ඉල්ලුම්කරු හෝ මියගිය අයගේ ළඟම ඥාතීන් විසින් ආදාහනාගාර භාරකරු වෙත ලබා දිය යුතු ය.

13. ආදාහනාගාරයෙන් ඉවත් කරනු ලබන භස්මාවශේෂ 12 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන අනුව භාර දී ඇති භාජනයකට දමා ප්‍රවේශම් සහිතව තත්කාර්යය සඳහා වෙන් කොට ඇති කොටසේ හෝ භූමියේ ආදාහනාගාර භාරකරු විසින් තැබිය යුතු ය.

14. ආදාහනාගාරයෙන් ඉවත් කරනු ලබන භස්මාවශේෂ සහිත භාජනය දින 14 ක් ඇතුළත මියගිය අයගේ ඥාතීන් විසින් හෝ ඉල්ලුම්කරු විසින් රැගෙන නොගියහොත් හෝ 12 වැනි වගන්තියට අනුව භාජනයක් නොසපයන්නේ නම්, තත්කාර්යය සඳහා සුසාන භූමියේ වෙන් කොට ඇති කොටසේ සභාව විසින් භූමිදානය කළ යුතු ය.

15. ආදාහානාගාරයෙන් ඉවත් කරනු ලබන භෂ්මාවශේෂ ඉල්ලුම්කරුට හෝ මියගිය අයගේ ළඟම ඥාතීන් හැර වෙනත් පුද්ගලයෙකුට භාර නොදිය යුතු ය.

16. සභාපති වරයා විමසා ආදාහනාගාර භාරකරුවෙකු, සහායකයකු හා මුරකරුවෙකු සබරගමුව පළාත් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

17. ආදාහනාගාර භාරකරු ආදාහනාගාරයත්, ඒ අවටත්, පිරිසිදුව හා දැකුම්කළුව පවත්වාගෙන යා යුතු ය.

18. සභාපතිවරයා විසින් හා ලේකම්වරයා විසින් පවරනු ලබන රාජකාරි ලැයිස්තු අනුව ආදාහනාගාර භාරකරු ක්‍රියා කිරීමට යටත් විය යුතු ය.

19. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසර නොමැතිව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල්වීම වරදකි. එසේ වුව ද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍රලාභියෙකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබේ.

20. ආදාහනාගාර පරිශ්‍රයට මෙහි 08 වන වගන්තියේ සඳහන් කාල වේලාවෙන් බැහැරව විධිමත් අවසරයක් නොගෙන කිසිවෙකු ඇතුල් නොවිය යුතු ය. ආදාහනාගාර කටයුතුවලින් පසු කිසිම කෙනෙකු නිකරුනේ එහි හැසිරීම හෝ කාලය ගත කිරීම නොකල යුතු ය.

21. සාමයට හා ආදාහන කටයුතුවලට බාධා වන ලෙසට යම් පුද්ගලයකු හැසිරෙන්නේ නම්, ආදාහනාගාර භාරකරුට එම පුද්ගලයා ආදාහනාගාර පරිශ්‍රයෙන් ඉවත් කිරීමට බලය ඇත්තේ ය.

22. මියගිය අයට අවසන් ගෞරවය දැක්වීමට පැමිණෙන කිසිම පුද්ගලයකු සුසාන භූමියේ කිසිම ස්මාරකයකට හෝ ආදාහනාගාර ගොඩනැගිලි, දේපලවලට හෝ අලාභ වන අන්දමින් හෝ මළ ගිය අයට අගෞරවයක් වන අයුරින් නොහැසිරිය යුතු ය.

23. 22 වන වගන්තිය උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තෙකුට සුසාන භූමි හා මිනීපිටි ආඥා පනත් විධි විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

24. ආදාහනාගාරයට හෝ ආදාහනාගාර පරිශ්‍රයේ ඇති ඉදි කිරීමකට හෝ සවිකිරීමකට කිසියම් අලාභයක් හෝ හානියක් සිදු කිරීම හෝ අදාහනාගාරයේ සේවයේ නියුතු භාරකරු, සහායකයින් හෝ සේවකයින්ගේ සේවා කටයුතුවලට බාධා කිරීමක් හෝ තර්ජනය කිරීමක් හෝ බලපෑම් කිරීමක් හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම වරදක් වන්නේ ය.

25. ආදාහනාගාරය වෙන් කරනු ලබන අය විසින් හෝ ඔවුන්ගේ සහායක අය විසින් හෝ 27 වන වගන්තියෙන් සඳහන් අවස්ථාවක දී හෝ ආදාහනාගාරයේ හෝ එහි යම්කිසි දේපලකට හෝ ගොඩනැගිල්ලකට හෝ උපකරණයකට අලාභයක් වුවහොත් සභාපතිවරයා නියම කරනු ලබන තක්සේරු වටිනාකම ගෙවීමට ආදාහනාගාරය වෙන් කරනු ලබන අය එකඟ විය යුතු ය.

26. මෙම අතුරු ව්‍යවස්ථාවේ 20, 24, 25 වගන්ති කඩ කිරීම වරදක් වන අතර ඒ සම්බන්ධයෙන් කිසියම් තැනැත්තකු නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 16 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියෙන් නියම කර ඇති දඬයකට යටත් වන්නේ ය.

27. මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරයට භාර දීමෙන් පසුව ආදාහනය කරන අතරතුර දී හෝ ආදාහනය කිරීමට පෙරාතුව හෝ ආදාහනාගාර යන්ත්‍රවල කාර්මික දෝෂයක් හෝ විදුලිය ඇනහිටීමක් හෝ මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත් එම මෘත ශරීරය භූමිදාන කිරීමට තීරණය කිරීමේ බලය සභාපතිවරයා සතු ය. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන යම් ගැටළුවක දී සභාපතිවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

28. මෘත ශරීර ආදාහනය කිරීම සඳහා අයකර ගත යුතු ගාස්තු ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මගින් වාර්ෂිකව පනවනු ලැබිය හැකි ය. එසේ පනවනු ලබන ගාස්තු ප්‍රාදේශීය සභාව අවශ්‍ය යැයි සලකනු ලැබූ අවස්ථාවල දී සංශෝධනය කළ හැකි ය.

29. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල

"සභාව" යන්නෙන් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද,

"ලේකම්" යන්නෙන් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වරයාද,

"ආදාහනාගාර භාරකරු" යන්නෙන් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ දාමහන ආදාහනාගාරයේ, ආදාහනාගාර භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති ආදාහනාගාර භාරකරුද,

"මෘත ශරීරය" යන්නෙන් මිනිස් මළ සිරුරක් ද අදහස් වේ.

30. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල නොගැලපෙන යම් අවස්ථාවක දී සිංහල පිටපත බල පැවැත් වේ.

### *"අ" උපලේඛනය*

*බළන්ගොඩ දාමහන ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
ලිපිනය :————.
ජාතික හැඳුනුම්පත් අංකය :————.
ග්‍රාම සේවා කොට්ඨාසය :————.

02. මියගිය තැනැත්තාගේ නම :————.
පදිංචිව සිටි ලිපිනය :————.
ග්‍රාම සේවා කොට්ඨාසය :————.
ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධතාවය : ————.

04. මරණ සහතිකයේ අංකය හා දිනය :————.

05. මරණය ලියාපදිංචි කරන ලේකම්ගේ නම හා ලිපිනය :————.

06. මරණය සිදු වූ ආකාරය :————.

07. මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් දිනය හා වේලාව :————.

08. පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :————.

09. පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :————.

10. මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර ලබා දෙන්නේ ද යන වග :————.

11. ආදාහනය කිරීම අවශ්‍ය දිනය හා වේලාව :————.

12. ආදාහනයෙන් පසු භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා නම හා ලිපිනය ලියූ භාජනයක් සඳහා :————. ඇත/නැත

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. මාගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් සහ මරණ සහතිකයේ පිටපතක් අමුණා ඇත.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි**

01. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි

20........................ දින පෙ.ව./ප.ව.................................. ට දාමහන ආදාහනාගාරයේ දී ........................................ යන අයගේ මෘත ශරීරය ආදාහනය කිරීම අනුමත කරමි.

02. පහත හේතු මත අවසරපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමි.

————,
අත්සන
සභාපති/බලයලත් නිලධාරි.

දිනය :————.
සභාපතිතුමා/බලයලත් නිලධාරි-

01. ලේඛනයේ සටහන් කරන ලදී.

20...................... දින අංක............................. දරන ලදුපතින් රු....................ක් ආදාහනාගාර ගාස්තු වශයෙන් හා තැන්පත් රු......................... ක් වශයෙන් අයකර ගන්නා ලදී.

02. අවසර පත්‍රය අත්සන සඳහා ඉදිරිපත් කරමි.

03. ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු ඇතුළත් ලිපි අත්සන සඳහා ඉදිරිපත් කරමි.

————,
විෂයභාර නිලධාරි.

11-655

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.